# පාසල් වියේ පසුවන දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි ජංගම දුරකථන භාවිතයේ බලපෑම.

ඒ.ඒ.එස්.වර්ණකුලසූරිය, එච්.ඒ.ආර්.චමරි

shashini.kln@gmail.com , harchamari@gmail.com

**හැඳින්වීම**

මනුෂ්‍ය ළදරුවා මෙලොවට බිහි වූ විට මුල්දීම ඔහු ඉවෙන් බොහෝ දේ දැන ගන්නේ ය. ඔහු ලොවට ඇතුළු වන්නේ ජීව විද්‍යාත්මක ආකාරයෙනි. උපදින විට දරුවා මනුෂ්‍යයෙක් වීමේ ශක්තිය ඇතිව උපදින්නේ ය. ඔහු පුද්ගලයෙකු හෝ මිනිසෙකුව, විවිධ ප්‍රවාහයන් තුළින් මේ අත්දැකීම් ලබා ඇත. හෙතෙම, සමාජානුයෝජනයට හසුවෙයි. එවිට සමජානුයෝජනයෙන් කියවෙන්නේ පුද්ගලයෙකු ඒක්තරා සමාජයක ක්‍රියාත්මක ලෙස ජීවත්වන පුද්ගලයෙකු බවට පත්වන බව නිසා, ඔහු එසේ සමජානුයෝජනයට පත්වන අතර ඒ සමාජයේ නීතී රීති හා සම්ප්‍රදායන්ට හුරු වන්නේ ය. එසේ වීමෙන් ඔහු මනා පෞරුෂත්වයක් ඇති පුද්ගලයෙකු ලෙස වර්ධනය වේ. මිනිසා සමාජමය වූ ද, සංස්කෘතිකමය වූ ද, සත්ත්වයෙකි. ඔහුගේ පෞර්ෂය දියුණු කර ගන්නට අවස්ථාව ලබා දෙන්නේ සංස්කෘතිය මඟිනි. පෞරුෂ දියුණුව ඉබේ සිදුවන දෙයක් නොවේ. හැම සමාජයක්ම එහි උපන් පුද්ගලයා සමාජමය වශයෙන් පුහුණු කරන්නේ කෙසේද?, ඒ සඳහා පිළියෙල කරගත් මාර්ග සකස් කොට ඇත. ළදරුවා උපදින විට මෙම පුහුණුව ඔහුට පවුලෙන් ලැබෙන්නේ ය. සමාජානුයෝජනය සිදු වන්නේ සංස්කෘතිය මඟිනි. සෑම සමාජයකම සංස්කෘතියක් ඇති නිසා සමාජානුයෝජනය වන ආකාරය සමාජයෙන් සමාජයට වෙනස් ය. එනම් සංස්කෘතිය හා එකම සමාජානුයෝජන ප්‍රවාහය එකම සමාජයක ජීවත් වන අයගේ පෞරුෂය කෙරෙහි විවිධ ආකාරයෙන් බලපානු ලැබේ. සංස්කෘතිය, පෞරුෂය දියුණුවට බාධා ඇති කරවන බව සැලකේ. සංස්කෘතිය හා සමාජය එකින් එක ගැටීමෙන් තම පෞරුෂය සකස් කරයි.

සරල සමාජය සංකීර්ණ සමාජයක් දක්වා ගමන් කිරීමේ දී නූතනයේ නැතුවම බැරි මූලික මිනිස් අවශ්‍යතාවයක් බවට ජංගම දුරකථනය පත්ව තිබෙන ආකාරය හඳුනාගත හැකිය. මිනිස් පැවැත්ම චිරස්ථායි කරනු වස්, ලෝක ඉතිහාසය පුරා බලපෑම් සහගත වූ සාධක අතර, මානව සන්නිවේදන හැකියාවන්ට හිමිවනුයේ අද්වීතිය ස්ථානයකි. "මානව සන්නීවේදනය" අන්තර්පුද්ගල සන්නීවේදනයේ සිට මිලියන සංඛ්‍යාත ජන රාශීන් වෙත, සමූහයන් වෙත කෙරෙන පොදු ආමන්ත්‍රණයක් දක්වා වූ, අතිශය පුළුල් පරාසයක පැතිරෙමින් මානව සමාජයේ විවිධ අවශ්‍යතා හසුරවනු ලබන්නා වූ ප්‍රධාන බලවේගයක් ලෙස ක්‍රියා කරන බව නොරහසකි. සමාජ අන්තර් ක්‍රියා පවත්වා ගැනීම කෙරෙහි භාෂාව මූලික වූ සන්නිවේදන උපක්‍රම නිරන්තරයෙන් අවශ්‍ය වේ. නූතන සමාජ පරිසරය තුළ අන්තර් පුද්ගල සන්නීවේදනය කුළු ගන්වන කේන්ද්‍රීය උපකරණය බවට ජංගම දුරකථනය පත්වන බව කිව හැකිය. මිනිසාගේ ආරම්භය හා සන්නිවේදනයේ ආරම්භය සිදු වූයේ, එකම අවස්ථාවේ දී බව මානව විද්‍යාඥයින් ද දක්වා ඇත. ඈත අතීතයේ සිට ම සන්නිවේදනය මිනිසාගේ මූලික අවශ්‍යතාවයන් අතර ප්‍රමුඛස්ථානයක් හිමිකරගෙන ඇති ආකාරය දක්නට ලැබේ. වර්තමානයේ පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය සහ ජංගම දුරකථනය ආදී සන්නිවේදන මාධ්‍යන් රාශියක් ඉතා දියුණු ස්වභාවයෙන් ව්‍යාප්ත වීමත්, භාවිතයට

ගැනීමත්, සිදු වුවත් දුරකථන සන්නිවේදනයට ප්‍රමුඛස්ථානයක් හිමිවන ආකාරය හඳුනාගැනීමට හැකියාව පවතී. අතීතයේ තිබූ නිර්වාචික සන්නිවේදනය වැඩි දියුණුවීමත් සමඟ වර්තමානයේ දියුණු සන්නිවේදන ඒකකයක් බවට දුරකථනය පත් වන්නේ, එහි ඇති සුවිශේෂී වූ සන්නිවේදන ගුණාංග හේතුවෙන් බව සඳහන් කළ යුතුය. වර්ෂ 1875 දී ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් විසින් දුරකතනය සොයා ගැනීමත් සමඟ දුරකථන සන්නිවේදන විප්ලවය ආරම්භ වූ අතර, වර්ෂ 1881 දී එහි ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ පළමු දුරකථනය ස්ථාපිත විය. කාලයත් සමඟ ඇති වූ විවිධ සොයා ගැනීම් ආදියට අනුව සන්නිවේදන තාක්ෂණය ද දියුණු වූ අතර ලංකාවේ මේ වන විට ස්ථාවර දුරකථන සමාගම් පහක් සහ ජංගම දුරකථන සමාගම් පහක් ස්ථාපිත වන්නේ ද, ශ්‍රී ලාංකික දුරකථන සන්නිවේදන සේවාව ඉතා පුළුල් ආකාරයෙන් ව්‍යාප්ත කරවීම සඳහා ය. ස්ථාවර රැහැන් සහිත දුරකතන සන්නිවේදන තාක්ෂණයට පසුව පැමිණි ජංගම දුරකථන හා ස්ථාවර රැහැන් රහිත දුරකතන තාක්ෂණයත්, 3G, Wi-Max, WiFi වැනි තාක්ෂණික ප්‍රමිතීන් හඳුන්වා දීමත් සමඟ දත්ත හා සන්නිවේදන ක්ෂේත්‍රයේ පුළුල් වර්ධනයක් සිදු වී ඇත. මෙලෙස ආරම්භ වූ ජංගම දුරකථනය අද වන විට විවිධ සේවාවන් රැසක් සමඟ ස්මාර්ට් ජංගම දුරකථන දක්වා වර්ධනය වී ඇති ආකාරය හඳුනාගත හැකිය. එමෙන්ම විවිධ සේවාවන් පාරිභෝගිකයන්ට ලබා දීමට කටයුතු කර ඇති අතර, එමඟින් යහපත් බලපෑම් මෙන්ම අයහපත් බලපෑම් ද දක්නට ලැබේ. විශේෂයෙන් පාසල් වියේ පසුවන දරුවන් මෙම ජංගම දුරකථන භාවිතයට නූතනයේ දී වැඩි නැඹුරුතාවක් දක්නට ලැබීම සාධනීය මෙන්ම නිශේධනීය බලපෑම් ද ඇති කරන්නකි. මෙකී තත්වය ඔවුන්ගේ සමාජානුයෝජනයට කෙසේ බලපෑමක් කරන්නේද යන්න මෙම අධ්‍යයනයේ දී සොයා බලන ලදී. යොවුන් වියෙහි තීරණාත්මක අවධියක් බවට පත්වන මෙකී අවධියේ දි දරුවන් මුළුමනින් ම සමාජයට අනුගත නොවූ පිරිසකි. තවමත් දෙමව්පිය ආදරය, කරුණාව, සෙනෙහස මධ්‍යයෙහි හැදී වැඩෙන මෙම දරුවන් ක්‍රම ක්‍රමයෙන් සමාජය තුළ ස්වාධීනව කටයුතු කිරීමට හැකි පුද්ගලයකු බවට පත් කිරීම දෙමව්පියන්ගේ කාර්යභාරයකි. මෙහි දී මෙම දරුවන් සමාජයට අනුගත කළ යුත්තේ කෙසේද?, එහිදී ජංගම දුරකථනයෙහි පවතින අවශ්‍යතාවය, මෙවන් සන්නිවේදන උපකරණවලින් තොරව දරුවා සමාජය සමඟ සජීවී ආකාරයට සම්බන්ධ කළ නොහැකිද? යන්න අධ්‍යනයට බඳුන් කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව තිබේ. කුඩා දරුවාගේ පටන් ජනප්‍රිය උපාංගයක් බවට පත්ව ඇති ජංගම දුරකථනය පාසල් අධ්‍යාපනය ලබන දරුවන් හට භාවිතයට ලබා දීම මගින් දරුවන්, දෙමව්පිය දූ දරු සබඳතාවන්ගෙන් ඈත්ව පවුල තුළ, සමාජය තුළ, හුදකලා තත්වයකට පත්ව ඇති ආකාරය නිරන්තරව දැකගත හැකිය. මෙකී තත්ත්වය මඟින් එම දරුවා තුළ මානසික විපර්යාසයක් ඇති කිරීමට හැකිවීම ද නොඅනුමානය.

**අධ්‍යයන ගැටලුව**

නවීන තාක්ෂණයේ නැඟී ඒමත් සමඟ ජංගම දුරකථන තාරුණ්‍යයේ මෙන්ම වැඩිහිටි සහ ළමා පරපුර අතර ද ජනප්‍රිය උපාංගයක් බවට පත්ව ඇත. නමුත් මෙම ජංගම දුරකථන තාක්‍ෂණය භාවිතය පාසල් වියේ පසුවන දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි සිදුකරන බලපෑම කෙබඳුද යන්න අධ්‍යයනය කිරිම මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව විය.

**අධ්‍යයන අරමුණු**

1. පාසල් වියේ පසුවන දරුවන්ගේ ජංගම දුරකථන භාවිතයේ ස්වභාවය හඳුනා ගැනීම.
2. ජංගම දුරකථන භාවිතය මගින් ඇතිවන ගැටලුකාරී තත්ත්ව විමර්ශනය කිරීම.
3. ජංගම දුරකථනය විධිමත් ආකාරයට භාවිත කළ හැකි ක්‍රම පිළිබඳ සොයා බැලීම.
4. ජංගම දුරකථන භාවිතය මගින් දරුවාගේ අන්තර් සබඳතාවන්ගේ පවතින වෙනස්කම් හඳුනා ගැනීම.
5. ජංගම දුරකථන භාවිතය දරුවනගේ චර්යා රටාවන් වෙනස් කිරීම කෙරෙහි බලපා ඇත්දැයි සොයා බැලීම.
6. දරුවා සමාජගත වීමේ දි ජංගම දුරකථනයේ අවශ්‍යතාවය විමර්ශනය කිරීම.

**අධ්‍යයන ක්‍රමවේදය**

අධ්‍යයනයේ සමස්ථ නියැඳිය 60ක් විය. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මිශ්‍ර ක්‍රමවේදය යොදා ගනී. විශේෂයෙන් ම බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කරයි. ඊට ප්‍රධාන හේතුව වන්නේ ලංකාවේ පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව සැලකීමේ දි කොළඹ දිස්ත්‍රික්කයට පසුව වැඩිම පාසල් ශිෂ්‍ය සංඛ්‍යාවක් නියෝජනය කරන දිස්ත්‍රික්කය බවට ගම්පහ දිස්ත්‍රික්කය පත් වේ. පාසල් සිසුන් 361,780 ක් ගම්පහ දිස්ත්‍රික්කය තුළ අධ්‍යාපනය ලබන බව 2017 වාර්ෂික පාසල් සංගණනය මගින් තහවුරු වී තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන ව්‍යාප්තිය සැලකීමේ දි බස්නාහිර පළාතට ප්‍රමුඛස්ථනයක් හිමි වීමත්, බස්නාහිර පළාත නියෝජනය කරනු ලබන එක් දිස්ත්‍රික්කයක් බවට ගම්පහ දිස්ත්‍රික්කය පත් වීමත් හඳුනාගත හැකිය. නියදියට අදාළව ගම්පහ දිස්ත්‍රික්කයේ උපකාරක පංති ආශ්‍රිතව උසස් පෙළ අධ්‍යාපනය ලබන සිසුන් ආශ්‍රයෙන් පර්යේෂණය සිදු කරන ලදි. පර්යේෂණයට ආදාළ දත්ත රැස් කිරීමේ දි ප්‍රාථමික සහ ද්වීතියික දත්ත භාවිතා කරයි. කේෂ්ත්‍ර සමීක්ෂණය තුළ ප්‍රශ්නාවලී ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් විධිමත්ව ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදි. මෙම පර්යේෂණය සඳහා ද ද්විතියික දත්ත යොදා ගත් අතර එහි දි පර්යේෂණ වාර්තා, සංගණන වාර්තා, පර්යේෂණ මාතෘකාවට අදාළ වාර්ෂික වාර්තා, දිස්ත්‍රික්ක සංඛ්‍යාලේඛණ අත්පොත්, විදුලි සංදේශ වාර්තා, මහ බැංකු වාර්තා, මෙන්ම පර්යේෂණ මාතෘකාවට අදාළව ලියවී ඇති පොත් පත්, සඟරා, අන්තර්ජාලය මඟින් පර්යේෂණය සඳහා අවශ්‍ය ද්විතියික දත්ත සපයා ගන්නා ලදි. මෙම පර්යේෂණයේ දි ප්‍රශ්නාවලියක් මගින් ලබා ගත් ප්‍රමාණාත්මක දත්ත පරිඝනක මෘදුකාංග මගින් නිවැරදිව සහ පහසුවෙන් විශ්ලේෂණය කර ගත හැකි බැවින් SPSS (Statistical Package for Social Sciences) සහ Microsoft Excel යන මෘදුකාංග, දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලදි.

**නිගමන**

සමාජය හා මුහු වෙන නවක සමාජිකයා එම සාමාජ සංස්කෘතියට අනුගත පුද්ගලයෙකු බවට පත් කරනු ලබන්නේ සමාජානුයෝජනය මඟිනි. මෙලෙස සමාජයට එක්වන නවකයා සමාජගත කිරීමේ කාරකයන් රාශියක් දැකගත හැකි අතර එහි දි ප්‍රාථමික සමජානුයෝජන කාරක සහ ද්වීතියික සමජානුයෝජන කරක සුවිශේෂී ස්ථානයක් හොබවයි. මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනයට බඳුන් කොට ඇත්තේ, වර්තමානය

වන විට ඉතා වේගයෙන් ප්‍රසාරණය වන දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි අතිශය වැදගත්කමක් දක්වන ජංගම දුරකථන, පාසල් වියේ පසුවන දරුවන්ගේ සමාජානුයෝජනය හැඩගැස්වීම කෙරෙහි බලපාන ආකාරයයි. මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය අනුව යමින් අරමුණු සාධනය කර ගැනීම අරඹයා එළැඹි නිගමනයන් පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

- **පාසල් ළමුන්ගේ ජංගම දුරකථන භාවිතයේ ස්වභාවය හඳුනා ගැනිම**

බොහෝ විට වත්මන් සමාජයේ දෙමව්පියන් තම දරුවාගේ ආරක්ෂාව පතා, දරුවාගේ දක්ෂතා දැක සතුටුව ත්‍යාග දීමක් ලෙසත්, දරුවාව සතුටු කිරිම අරඹයාත්, දරුවාගේ ඉල්ලීම් ඉෂ්ට කිරිම වස් ජංගම දුරකථන ලබා දීමේ ප්‍රවණතාවය ඉහළ මට්ටක තිබෙන ආකාරය ප්‍රකට වන කරුණක් බවට පත් වේ. එමෙන්ම සාමාන්‍ය ජංගම දුරකථන භාවිත කරන සිසුන්ට වඩා ස්මාර්ට් ජංගම දුරකථන භාවිත කරන සිසුන් ජංගම දුරකථන දෙකක් භාවිත කරන බව තහවුරු විය. විශේෂයෙන් පිරිමි ළමුන් කෙරෙන් මේ තත්ත්වය වැඩි වශයෙන් දැකගත හැකි බවට නිගමනය කළ හැක. දෛනික ජීවිතය තුළ තම අධ්‍යාපනය වෙනුවෙන් වැය කළ හැකි කාලය ජංගම දුරකථනය වෙතට යොමු කර ඇති ආකාරය මෙම පර්යේෂණය මගින් අනාවරණය විය. එහි දි වැඩි සිසුන් ප්‍රමාණයක් ජංගම දුරකථනය සඳහා දෛනිකව පැය 1-3ත් අතර කාලයක් යොදවන බවට තහවුරු වු අතර, ඔවුන් මෙලෙස ජංගම දුරකථන භාවිතය එදිනෙදා ජීවිතයේ දි විවේක කාලය ගත කිරිම සඳහා වැඩි වශයෙන් යොදා ගනී. මෙහි දි දරුවන් විඩියෝ පට නැරඹීමට, ගීත ඇසීමට, චිත්‍රපට නැරඹීමට ජංගම දුරකථනය වැඩි වශයෙන් භාවිත කරන බව තහවුරු විය. බෙහෝ දරුවන් මේ ආකාරයට ජංගම දුරකථන හරහා අසභ්‍ය වීඩියෝ පට නැරඹීමට ඉහළ ප්‍රවණතාවයක් දක්වන බව ගුරුවරුන්ගේ අදහස් තුළින් එළඹිය හැකි නිගමනයක් බවට පත් විය. නිරන්තර නිවසේ දි පවා ජංගම දුරකථනයේ එල්බ සිටින බවටත්, මව්පිය පිය දු දරු සබඳතා වෙනුවට ජංගම දුරකථන සබඳතා කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන ආකාරයත්, හුදෙක් ජංගම දුරකථන රසාස්වාදය පිණිස නිවස තෝතැන්නක් වී ඇති ආකාරයත්, මෙම පර්යේෂණය තුළින් තහවුරු විය. ජංගම දුරකථනයක් භාවිත කිරිමට හේතුව සහ වැඩිපුර භාවිතය මඟින් නිගමනය කළ හැක්කේ හුදෙක් සන්නිවේදන කටයුතු උදෙසා ජංගම දුරකථනය වැඩිපුර භාවිත කරන බවත්, එමෙන්ම සන්නිවේදන කටයුතු වල පහසුව සඳහා වැඩි වශයෙන් ජංගම දුරකථණ භාවිත කිරිමේ ප්‍රවණතාවයක් මෙමඟින් සනාථ විය.

- **ජංගම දුරකථන භාවිතයෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්ව හඳුනා ගැනීම.**

ජංගම දුරකථන භාවිතය හරහා වර්තමානය වන විට විශාල පිරිසක් ගැටලුකාරී තත්ත්වයන්ට ගොදුරුව තිබෙන ආකාරය දැකගත හැකිය. ජංගම දුරකථනය බහුවිධ සන්නිවේදන මාධ්‍යක් වීම නිසා සමාජ ජාල හරහා ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දුන් පිරිසක් ද අනාවරණය කර ගත හැකි වු අතර, සමාජ ජාලයන්ට අමතරව ජංගම දුරකථනය භාවිතය හරහා ද විවිධ ප්‍රයෝජන මෙන්ම ගැටලුවලට ලක් වු පිරිස් හඳුනාගත හැකි විය. දරුවන් අනවශ්‍ය ප්‍රේම සබඳතා කෙරෙහි යොමුවන ආකාරය මෙහි දි අනාවරණය කරගත් අතර බොහෝ දරුවන් තම තනිකම, පාලුව නැති කර ගැනීම සඳහා නිශේධනාත්මක ලෙස ලෙස ජංගම දුරකථනය යොදා ගන්නා අකාරය සනාථ විය. මෙහි දි නිගමනය කළ හැක්කේ දරුවන් ජංගම දුරකථන භාවිතය සඳහා ඇබ්බැහි වී සිටින ආකාරයකත්, මුහුණු පොත හරහා විවිධ අපරාධයන්ට මොවුන් ගොදුරුව

තිබෙන අකාරයය. තම පෞද්ගලිකත්වය සමාජයට නිරාවරණය කිරීම සඳහා ජංගම දුරකථන යොදා ගන්නා බව මෙහි දි හඳුනගත හැකි සුවිශේෂි කරුණකි. තවද දරුවන්ගේ සිතීමේ සහ නිර්මාණාත්මක හැකියාව දුර්වල කරන උපකරණයක් ලෙස ජංගම දුරකථනය පත්ව ඇති බව නිගමනය කළ හැක.

- **ජංගම දුරකථනය විධිමත් ආකාරයට භාවිත කළ හැකි ක්‍රම**

ජංගම දුරකථනය විධිමත් ආකාරයට භාවිත කළ හැකි ක්‍රම පිළිබඳව මෙම පර්යේෂණයේ දි අධ්‍යනයට ලක් කළ අතර එහි දි අධ්‍යාපනික කටයුතු වෙනුවෙන් පාසල් දරුවන් ජංගම දුරකථනය භාවිත කරනු ලබන ආකරය පිළිබඳව විමසන ලදි. එහි දි 28% ක ප්‍රතිශතයක් තුළින් සනාථ වුයේ අධ්‍යාපනික කටයුතු වෙනුවෙන් ජංගම දුරකථනය භාවිත කරනු ලබන බවය. ජංගම දුරකථනය මඟින් නිශේධනාත්මක දෑ පමණක් නොව එලදායි දේවල් ද පාසල් දරුවෙකුට උකහා ගත හැකි බව මෙමගින් නිගමනය කළ හැකිය.

- **ජංගම දුරකථන භාවිතය මඟින් අන්තර් සබඳතාවල ඇතිවන වෙනස්කම්**

ජංගම දුරකථන භාවිතයට යොමු වීමත් සමඟ දරුවා ජංගම දුරකථනය මත හුදකලා වන තත්ත්වයක් දැකගත හැකිය. එම නිසා මෙම පර්යේෂණය ඔස්සේ දරුවන් ජංගම දුරකථනයට යොමු වීමත් සමඟ පවුල සමග පවත්වන සබඳතාවයේ ස්වරූපය දුරස් වන අතර, ජංගම දුරකථනය හරහා මිතුරු ඇසුර පවත්වාගෙන යන ආකාරය වැඩි වශයෙන් පවතින බව නිගමනය කළ හැකිය. දරුවාගේ ජංගම දුරකථන භාවිතයට නිවසෙන් අනුබලයක් ලැබෙන ආකාරය ජංගම දුරකථන රිචාර්ච් කිරීමට නිවසින් මුදල් ලබා දීම වැඩි වශයෙන් පැවතීම මඟින් සනාථ කරගත හැකිය. මෙහි දි හඳුනාගත හැකි සුවිශේෂම දේ වනුයේ ජංගම දුරකථනය භාවිතය මඟින් දරුවන් දෙමව්පියන්ගෙන් දුරස්වන තත්ත්වයක් ඇති වීමය.

- **ජංගම දුරකථන භාවිතය දරුවන්ගේ චර්යා රටාවන්ගේ වෙනස්කම් ඇති කිරීම කෙරෙහි බලපා ඇති ආකාරය**

මෙහි දි දරුවාගේ සමාජ සබඳතා, අධ්‍යපනික කටයුතු, පවුල් සබඳතා, කාල කළමණාකරණය, පෞද්ගලික ආරක්ෂාව, සන්නිවේදන කටයුතු, ආදිය පිළිබඳ ජංගම දුරකථනයට පෙර යහපත් මට්ටමක පැවති බවත් ජංගම දුරකථනය භාවිතයට යොමු වීමත් සමඟ එම තත්ත්වය වෙනස්ව ඇති ආකාරයත් නිගමනය කළ හැකිය. දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු කෙරෙහි පවතින උනන්දුව සම්පුර්ණයෙන්ම ජංගම දුරකථනය වෙත යොමු වන අකාරයත්, දරුවා සමාජීය කටයුතු සහ නිවසේ සමාජිකයන් අතර පවතින අන්තර් සබඳතා ජංගම දුරකථනය මඟින් සිමා කර ඇති අකාරයත් මෙහි දි නිගමනය කළ හැකිය.

- **දරුවන්ගේ සමාජානුයෝජනයේ දි ජංගම දුරකථනයේ අවශ්‍යතාවය**

මෙහිදී දරුවෙකු සමාජගත පුද්ගලයෙක් බවට පත් වීමේ දි ජංගම දුරකථනය අවශ්‍යතාවය කොතෙක් ද යන්න පර්යේෂණයට බඳුන් විය. එහි දි 64% ක දත්ත මගින් ජංගම දුරකථනය අත්‍යවශ්‍ය අංගයක් නොවන බවට සනාථ විය. දරුවෙකුට ජංගම දුරකථන භාවිතයට ලබා දෙන්නේ නම් එහි දී දෙමව්පියන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු විය යුතු බවත් දරුවාට ජංගම දුරකථනය පිළිබඳ පැහැදිළි නිවැරදි

අවබෝධයක් ලබා දිය යුතු බව සනාථ වූ අතර අවසාන වශයෙන් දරුවෙකු සමාජයට යොමු කිරීමේ දී ජංගම දුරකථනය අත්‍යවශ්‍යම උපාංගයක් නොවන බව නිගමනය කළ හැකිය.

පර්යේෂණය මඟින් ලබා ගත් දත්තවලට අනුව එළඹිය හැකි අවසාන නිගමනය වනුයේ "පාසල් වයසේ පසුවන දරුවෙකුගේ සමාජානුයෝජනය කෙරෙහි ජංගම දුරකථනයේ බලපෑම සාධනීය තත්ත්වයක් මෙන්ම නිශේධනීය තත්ත්වයක් බවට පත්වන බවය". නවීන තාක්ෂණය හා ගැටෙන නූතන පරම්පරාව තාක්ෂණයෙන් වියුක්ත කර තැබීම අසීරු කර්තව්‍යයකි. එහෙයින් කළ යුත්තේ සංක්‍රාන්තික අවධියක පසුවන මෙම දරුවන් තාක්ෂණයෙන් වියුක්ත කර තැබීම නොව ඔවුන්ට ලබා දෙන ඔවුන් ගැටෙන නවීන තාක්ෂණය පිළිබඳ ප්‍රතිජනනාත්මක නිශේධනාත්මක තත්ත්ව ඉතා හොඳින් අවබෝධ කර දීම ය.

**මුඛ්‍ය පද : පාසල් දරුවන්, සමාජානුයෝජනය, ජංගම දුරකථන**

**ආශ්‍රිත ග්‍රන්ථ**


අභයසුන්දර, ප්‍රණීත් (2013). **මානව සමාජගත පවුල් සංකල්ප**, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

අමරසේකර, දයා (1987). **සමාජ විද්‍යා සරල ශාස්ත්‍රීය ලිපි**, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

අමරසේකර, දයා (1988). **ශ්‍රී ලංකා සමාජය : සමාජ විද්‍යාත්මක විමසුමක්**, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

අමරසේකර, දයා (1998). **සමාජ විද්‍යා විමර්ශන**, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

අමරසේකර, දයා සහ දහනායක, රෝහිත (2004). **ඉඳුවර පර්යේෂණාත්මක ලේඛණ සංග්‍රහය**, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

කරුණාතිලක, කේ (1998). **සමාජ විද්‍යා න්‍යාය**, මාලිංග ප්‍රකාශකයෝ, කඩවත.

කුමාර, හේමන්ත, එන්. වී. පී. ඒ (2012). **සමාජ විද්‍යා ප්‍රවේශය**, රුහුණු අධ්‍යයන කවය, මාතර.

**ජන හා නිවාස සංගණන** (2012). ජන හා ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ජයවීර, සුධීර (2015). **සෙල් ෆෝන් සංස්කෘතිය**, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ජයසිංහ, ඒ. කේ. පි (2005). **සමාජ මානව විද්‍යා මූලධර්ම**, එස්. ගොඩගේ සහ සහෝදයෝ, කොළඹ.

ජයසිංහ, ඒ. කේ. පි. (2013). **සමාජ විද්‍යාව මූලික සංකල්ප 1,** කඩුල්ල ප්‍රකාශන, කඩවත.

ජයසිංහ, ඒ.කේ.ජී (2013). **සමාජ විද්‍යාව මූලික සංකල්ප 2**, කඩුල්ල ප්‍රකාශන ,කඩවත.

ද සිල්වා, ආර්.ඩී.ඩී සහ එදිරිසිංහ, දයා (2010). **සමාජය හා සංවර්ධනය**, චත්මා ප්‍රකාශකයෝ, දෙහිවල.

දේවප්‍රිය, සිරිසේන (2000). **ගම්පහ දිසාව,** ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ධර්මසිරි, ලාල්, මර්වින් (2016). **සමාජීය විද්‍යා පර්යේෂණ**, කර්තෘ ප්‍රකාශන.

පල්ලියගුරු, චන්ද්‍රසිරි (1983). **සංස්කෘතියේ සමාජ මුහුණුවර**, පුබුදු මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, කොළඹ.

පල්ලියගුරු, චන්ද්‍රසිරි (1990). **සංස්කෘතිය සමාජය හා පෞරුෂය**, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

**මහ බැංකු වාර්තාව** (2017). ගුණසේන සහ සමාගම, කොළඹ.

රත්නපාල, නන්දසේන (2007). **මානව විද්‍යාව හා සමාජ විද්‍යාව**, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

රන්ජන්, ධර්ම ශ්‍රී (2004). **දාරක සමාජානුයෝජනය**, කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, ධනපාල (2006). **තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තියහ හා සංස්කෘතිය**, මහාචාර්ය තිස්ස කාරියවසම් **"අභිනන්දිකා"**, ගොඩගේ ප්‍රකාශකයෝ, මරදාන.

ITU, (2017) **Measuring the Information society**, International Telecommunication Union, Place des Nations, Geneva.

Campbell, M. (2005, 28 October 2005) **The impact of the mobile phone on young people's social life.** Paper Presented at the Social Change in the 21st Century Conference in School of Learning and Professional Studies, Queensland University of Technology. Queensland.

www.trc.gov.lk

Retrieved in 10 October 2018.

www.statistics.gov.lk

Retrieved in 01 October 2018.

ITU, 2017.Online statistics. http://www.itu.int/ITU-D/ict/statistics/

Retrieved in 29 September 2018.